රුහුණ විශ්වවිද්‍යාලය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

දෙවන සමාසික අවසාන පරීක්ෂණය - 2018 ජුනි/ජූලි

**MAE 5201 - රාජ්‍ය අංශයේ ආර්ථික විද්‍යාව**

කාලය : පැය 03 යි.

එක් කොටසකින් ප්‍රශ්න <u>දෙක (02)</u> බැගින් තෝරා ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න.

---

<u>I කොටස</u>

01.

i. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයභාර ව්‍යුහයෙහි කැපී පෙනෙන ලක්ෂණ කවරේද?

(ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ වර්තමාන බදු ව්‍යුහය වෙනස්විය යුතු යැයි ඔබ අදහස් කරන්නේද? එසේ නම් ඒ කවර ආකාරයෙන් දැයි යෝජනා කරන්න.

(ලකුණු 05)

02.

i. ඵලදායි රාජ්‍ය ණය (Productive Debt) සහ ඵලදායි නොවන රාජ්‍ය ණය (Unproductive Debt) වෙන්කොට හඳුනා ගන්න.

(ලකුණු 05)

ii. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණයෙහි මෑත කාලීන උපනතීන් පරීක්ෂා කරන්න.

(ලකුණු 05)

iii. "අනාගත පරපුර මත රාජ්‍ය ණය අනිවාර්යයෙන්ම බරක් පටවයි." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? හේතු දක්වන්න.

(ලකුණු 05)

03. පහත සඳහන් ඒවායින් ඕනෑම තුනකට (03) විස්තරාත්මක සටහන් ලියන්න.

i. බදු ආපාතය (Tax Incidence)
ii. අධි බදු බර (Excess burden of taxation)
iii. සංවර්ධනය වන රටවල රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ
iv. පොදු භාණ්ඩ බෙදාහැරීම පිළිබඳ පොදු සමතුලිතතා විග්‍රහය

(ලකුණු 15)

## II කොටස

04.

i. "සමාජ ප්‍රතිලාභ වියදම් විග්‍රහය දියුණු සහ දියුණු වෙමින් පවත්නා රටවල ව්‍යාපෘති අගය කිරීමට ප්‍රයෝජනවත් උපක්‍රමයකි." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. රාජ්‍ය අංශයේ ආර්ථික විද්‍යාව තුළ රාජ්‍ය වියදම් ඇගයීමේදී යොදා ගන්නා විවිධ ඇගයීමේ ක්‍රමයන්හි පොදු මූලධර්ම ලුහුඩින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය සීමා කරන බාධකයන් මොනවාද?

(ලකුණු 05)

05.

i. රාජ්‍ය අංශයේ ආර්ථික විද්‍යාව තුළ පොදු තේරීම පිළිබඳ න්‍යායයේ වැදගත්කම ලුහුඩින් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ii. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පද්ධති දියුණු වෙමින් පවත්නා ආර්ථිකයන්හි රජයේ හැසිරීම විග්‍රහ කිරීමට පොදු තේරීමේ න්‍යාය කොතෙක් දුරට අදාල වේද? යෝග්‍ය උදාහරණ සමඟ ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 08)

06.

i. "අයවැයෙහි ප්‍රාග්ධන වියදම් යනු ආර්ථික වෘද්ධියේ ඵලදායි හා බලවත් උපකරණයක් වෙයි." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. අයවැය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන්නේ කෙසේද?

(ලකුණු 05)

iii. මෑත කාලයේ ශ්‍රී ලංකාවේ අයවැය තුල ආර්ථික වෘද්ධිය වළක්වාලන සාධක කවරේද?

(ලකුණු 05)

@@@@@@@